# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2061/8 - 2018 මාර්තු මස 05 වැනි සඳුදා - 2018.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර-පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ අස්ගිරිය බූස්ටර් පොම්පාගාරය හා නළ මාර්ගයට ප්‍රවේශවීම සඳහා දැනට ඇති මාර්ගයේ පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 26 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1353

*උපලේඛනය*

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර හා ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 235 අස්ගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අස්ගිරිය ගමේ පිහිටි අබේසේකරලාගේ වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 04ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

කැබලි අංක 01

| | | |
|---|---|---|
| *උතුරට* | : | අබේසේකරලා සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ශ්‍රී ධර්මසිද්ධි මාවත ; |
| *දකුණට* | : | නොදනී ; |
| *බටහිරට* | : | අබේසේකරලා සහ තවත් අය හිමිකම් කියන ඉඩම. |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. ගරුතර විහාරාධිපති වහන්සේ,
ශ්‍රී විජයසුන්දරාරාමය,
අස්ගිරිය,
මහනුවර.

02. මහාභාරකරු,
මහාභාරකාර දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

03. කේ. ඩී. අයිරාංගනී පතිරණ මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

04. කේ. ඩී. නීද්‍රා අබේසේකර මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

05. කේ. ඩී. සුමිත්‍රා අබේසේකර මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

06. නන්දා අබේසේකර මිය,
අංක 25, ශ්‍රී ධම්මසිද්ධි මාවත,
අස්ගිරිය,
මහනුවර.

03-770

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.